# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## <u>කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් මත පදනම්ව එදිනෙදා කටයුතු  වලට බාධා කිරීම</u>

## සහෝදර ජනතාව වෙත කරනු ලබන ආයාචනයයි

පසුගිය සති දෙක ඇතුලත පොදු ස්ථාන වලට හා පොදු ගොඩනැගිලි තුලට තමන් ඇතුළුවීම වලක්වන බවට නොයෙකුත් කාන්තාවන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇත. මෙවන් පැමිණිලි පිළිබඳව කොමිෂන් සභාව අතිශයින් සැලකිලිමත් වන අතර, නීතියට පටහැනිව ක්‍රියාකරන අවස්ථාවක හැරුණු කොට පොදු ස්ථානයකට ඇතුළුවීම  හැකියාව කිසිම පුද්ගලයකුට අහිමි කල නොහැකි බැව් අප ඔබගේ අවධානයට ලක් කර සිටිමු.

හදිසි රෙගුලාසිවලට සහ සාමාන්‍ය නීතියට පටහැනිව කටයුතු නොකරන පුද්ගලයන් හට පොදු ස්ථාන වලට හා පොදු ගොඩනැගිලි තුලට ඇතුළුවීම  වීමේ අයිතිය වැලැක්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන සහ 14 (1) (උ) වන වගන්ති යටතේ  ඔවුන්ගේ සමානාත්මතාවයේ අයිතිය සහ ශ්‍රී ලංකාව තුල යාමේ ඒමේ අයිතිය උල්ලංඝනය කිරීමට හේතු සාධක වන බව ඔබගේ අවාධනයට ලක් කිරීමට කැමැත්තෙමු. මෙසේ ඇතුළුවීම වීම වැලැක්වීමෙන් යම් අවස්ථාවලදී එම කාන්තාවන්ට අත්‍යවශ්‍ය සේවාවන් ලබාගැනීමට පවා නොහැකිවී ඇති බව අපගේ කොමිෂන් සභාවේ  අවධානයට යොමු කොට ඇත.

ඔබ දන්නා පරිදි හදිසි නීති රෙගුලාසි 32A ප්‍රකාරව පොදු ස්ථාන වලදී සම්පූර්ණ මුහුණම ආවරණය වන ආකාරයේ සියලු පැළඳීම් පමණක් තහනම් කර ඇත. මෙම රෙගුලාසියෙහි අරමුණ වන්නේ යම් කිසි පුද්ගලයකුගේ අනන්‍යතාවය  කිසිදු බාධාවකින් තොරව තහවුරු කර ගැනීමට අවකාශය සලසා දීම වේ.

මෙම තහනම් කිරීමට පටහැනි නොවන ආකාරයේ ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටි කාන්තාවන්ද (උදාහරන, අබායාව සහ මුහුණ ආවරණය නොවන හිජාබය) යම් ආයතන තුලට ප්‍රවේශ වීම වැලක්වූ බවට ලැබුණු පැමිණිලි කොමිෂන් සභාවේ අවධානයට ලක් වී ඇත. මෙසේ ප්‍රවේශය අවහිර කරන ලද කාන්තාවන් අතරට හිස් ආවරණ, හිස සහ නිකට වටා යන එක් පසෙකින් හෝ හිස පසු පසින් කටුවකින් රඳවා තබන ආවරණ පැළඳ සිටි කාන්තාවන්ද ඇතුලත් වේ. යම් අවස්ථාවන්හිදී තමන් හිසෙහි එක් පසකට රඳවන කටුව ඉවත් කිරීමට මෙම කාන්තාවන්ට සිදු වී ඇති අතර, එය ඔවුන්ගේ මුළු හිස් ආවරණයම කඩා හැලීමට හේතු  වී ඇත. ඒ සෑම අවස්ථාවකදීම මෙම කාන්තාවන් සම්පූර්ණ මුහුණ ආවරණය කර සිට නැත.

එමෙන්ම ආයතන වලට පිවිසෙන දොරටුව අසල සේවය කරන ආරක්ෂක නිලධාරීන් විසින් ඇතුළුවීමට අදාළ කටයුතු යම් අවස්ථාවලදී තම අභිමතය පරිදි සිදුකරන බව අප නිරීක්ෂණය කර ඇත්තෙමු. එම අවස්ථාවලදී ඔවුන් මුහුණ ආවරණය කර නොමැති, එහෙත් සම්පූර්ණ සිරුර ආවරණය වන සේ (අබායා) සැරසී සිටින කාන්තාවන්ට ආයතන තුලට ඇතුළුවීම වළකා ඇති බව පෙනී යයි.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් 2019.05.02 දිනැතිව නිකුත් කරන ලද ප්‍රතිකාර කිරීමේ ක්‍රියාපිළිවෙත සහ සේවාවන් සඳහා මුස්ලිම් කාන්තාවන් හට ප්‍රවේශය ලබා දීම සඳහා අදාළ වන මාර්ගෝපදේශ සහිත චක්‍රලේඛය මෙම කොමිෂන් සභාව අගය කර සිටිමු. එසේ නමුත් යම් අවස්ථාවන්හිදී මුහුණ ආවරණය නොවන ආකාරයේ ඇඳුම් ඇඳ සිටි කාන්තාවන්ට පවා ප්‍රතිකාර ලබා දීම යම් වෛද්‍ය නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර, රෝහල් කිහිපයකින්ම ඇතුළුවීමටද ඉඩ ලබා දී නොමැති බැව් අපට වාර්තා වී ඇත. යම් අවස්ථාවන්හිදී තම පිටත ඇඳුම් (අබායාව) සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලෙස කාන්තාවන්ට පවසා ඇත.


මෙසේ ඇතුළුවීම වළකා සිටීම සහ ඒ හේතුකොටගෙන තමන්ට අවශ්‍ය සේවාවන් (යම් අවස්ථාවලදී අත්‍යවශ්‍ය සේවාවන්) නොලැබී යාම දැඩි මානසික වේදනාවට සහ එමඟින් හුදෙකලාවූ හැඟීමකට හේතු වී ඇත. එමෙන්ම, මෙම කොමිෂන් සභාවට ලැබුන පැමිණිලි වලට අනුව, මෙම ක්‍රියාවලියේ ප්‍රතිපලය ලෙස, විවෘතව පොදු ජන ජීවිතයට ඉතාමත් සුහදව සහභාගී වෙමින් සිටි කාන්තාවන් තම නිවාස වලට කොටුවී ඇති බව අපට සනාථ වී ඇත. අපගේ රට ඉතා සංවේදී මොහොතකට මුහුණ පා සිටින මේ අවස්ථාවේ, මිනිසුන් අතර වෙනස්කම් මතුවන ආකාරයෙන් කටයුතු නොකොට, ඔවුන් අතර සාමය සහ සංහිඳියාව ඇතිවන ආකාරයෙන් කටයුතු කිරීම සඳහා අප සියල්ලන් සතුව වගකීමක් ඇති බව අප සිහිපත් කරමු.


මෙම තත්වය තුළ එදිනෙදා කටයුතු කිරිමේදි මුස්ලිම් කාන්තාවන් හට කරදර, හිරිහැර සහ අවමන්සහගත සැලකීම් සිදුකිරිම් වලට සම්බන්ධ නොවන ලෙස ඔබ සැම වෙතින් අප ඉල්ලා සිටිමු. එමෙන්ම, හදිසි රෙගුලාසි කඩ නොවන ආකාරයේ ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටින පුද්ගලයන්ට ආයතන/ස්ථාන වලට ඇතුළුවීමේ අයිතිය තහවුරු කිරිමත්, පොදු ප්‍රවාහන පහසුකම් භාවිතා කිරිම වැනි එදිනෙදා කටයුතු කරගෙන යැම සඳහාත්, ඔබට ලබාදිය හැකි උපරිම සහයෝගය ලබා දෙන ලෙසට අප ඔබගෙන් ඉල්ලා සිටිමු. තවද, මෙම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා, ඔබ අවට සිටින පුද්ගලයන්ද හදිසි නීති රෙගුලාසි යටතේ තහනම් කර නොමැති ආකාරයේ ඇඳුම් පැළඳුම් මොනවාද යන්න පිළිබඳව හැකි උපරිමයෙන් දැනුවත් කරන ලෙසද අප ඉල්ලා සිටිමු.

හදිසි රෙගුලාසි වලට අනුකූල වන හා අනුකූල නොවන හිස් ආවරණ වල රූපමය විස්තරයක් මේ සමඟ අමුණා එවා ඇත.

සභාපතිනී
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
2019/05/17.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka




| Banned | Not banned |
|---|---|
| Burqa | Chadors |
| Niqab | Hijabs |
| Fullface | Half |
| Modular | Openface |
| Off-road | Dual-Sport |